**ශීර්ෂය 118 - කෘෂිකර්ම , ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ **2019** දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත **2019** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර**,** 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්, තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කලමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම් ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග කළමනාකරණ අංශයට අයත් නේවාසික කාර්යාල 25 ක්, නිල නිවාස 10 ක් සහ සංචාරක බංගලාවක වටිනාකම තක්සේරු කර නොතිබුණු අතර එම වටිනාකම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. | සියලුම ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුවට තොරතුරු ඉදිරිපත් කර ඇත. එම වාර්තා ලද පසු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට සකස් කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතුව පවතින දේපළ පිරියත හා උපකරණවල වටිනාකම රු.434,958,714 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල රු.432,177,817 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.2,780,898 ක සැසඳුම් නොකළ වෙනසක් නිරීක්ෂණය විය. | සැසඳීම් කර වරද නිවැරදි කළ යුතුය. | මෙම වෙනස 2020 ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2019 වර්ෂයේදී අපහරණය කර තිබුණ කෘෂිකර්ම අමාත්‍යාංශය සතු වාහන 14 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙන් ඉවත් කර නොතිබුණි. | අපහරණය කරන ලද වාහන මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් ඉවත් කළ යුතුය. | එකඟ වෙමි. ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වූ වාහන 14 ක් අපහරණය කිරීමෙන් ලද රු.6,540,930 ක ආදායම මුදල් ප්‍රවාහන ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ පෙන්වියයුතු වුවද එය මුදල් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | වාහන අපහරණ ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් විමසා ඉදිරියේදී සිදු කිරීමට සටහන් කර ගනිමි. |

### 1.6.3 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ධීවර හා ජලජ සම්පත් අංශයේ මූල්‍ය ප්‍රකාශනවල රු.21,959,713 ක් වටිනා කාර්යාල ගොඩනැඟිලි 2019 වර්ෂය තුළ හුවමාරු වූ (Transfer) අයිතම වශයෙන් අපහරණයන් යටතේ දක්වා තිබුණද අපහරණය කර තිබුණු ගොඩනැඟිලි පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අපහරණය කර තිබුණු ගොඩනැඟිලි පිළිබඳ එක් එක් අයිතමයේ වටිනාකම සහිත ලේඛනයක් ඉදිරිපත් කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) ධීවර හා ජලජ සම්පත් අංශය විසින් 2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම යටතේ සංවර්ධන ව්‍යාපෘති 5 ක් වෙනුවෙන් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන 295 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් ඒ ඒ වැය | සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදනවල උපයෝජනය සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් අංශය විසින් අධීක්ෂණයක් හා පසුවිපරම් කිරීමක් සිදුකළ යුතු අතර අදාල තොරතුරු ද පවත්වා ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |

විෂයය සඳහා වැය කර තිබුණු රු.මිලියන 277 කට අදාළව අධිකාරිය විසින් ඉදිරිපත් කර තිබුණු මාසික සාරාංශ පදනම් කරගෙන අමාත්‍යාංශය විසින් ගිණුම්ගත කිරීම පමණක් සිදුකර තිබුණද ලිපිගොනු නඩත්තු කර නොතිබුණු හෙයින් ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට නොහැකි විය. එසේම ධීවර හා ජලජ සම්පත් අංශය විසින් අධිකාරිය හරහා ක්‍රියාත්මක කරනු ලබන මෙම සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමක් හෝ සිදුකර නොතිබුණි.

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි වාරිමාර්ග අංශයේ ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | මු.රෙ 502 (2) ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන අතර එය යාවත්කාලීන කිරීමට විෂය ලිපිකරු දැනුවත් කර ඇත. |

(ආ) ඇප ලේඛනය

| | | |
|---|---|---|
| වාරිමාර්ග අංශය විසින් මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු සියලු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනෝන්‍යාධාර ඇපකාර සංගමයේ ලියාපදිංචි වීමට කටයුතු කර ඇත. ලියාපදිංචිය ලද පසු ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරමි. |

## 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.4 හා 4.4 වගන්තිය | වයස අවුරුදු 55 එළඹීමට පෙර ණයකරු මියගිය හොත්/ කිනම් හේතුවක් නිසා හෝ සේවයෙන් විශ්‍රාම ගියහොත් එම සිද්ධිය සිදුවන අවස්ථාවේදී වූ ණය මුදල හා පොලියෙන් නොගෙවා ඉතිරිව තිබෙන ප්‍රමාණය ණයකරුගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිතයෙන් අයකර ගත යුතු විය. එහෙත් මියගිය සේවකයන් 15 දෙනෙකුගේ ආපදා සහ උත්සව ණය වෙනුවෙන් අය කර ගතයුතුව පැවති රු.158,464 ක ණය ශේෂ සහ විශ්‍රාම ගොස් වර්ෂ 05 ක කාලයක් ඉක්මවූ නිලධාරීන් 23 දෙනෙකුගෙන් අය විය යුතු රු.266,046 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ අදාළ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | අවු.30 ට වඩා පැරණි ණය ශේෂ බැවින් ලිපිගොනු සොයාගත නොහැකිවීමෙන් තොරතුරු සොයා ගැනීම අසීරු වී ඇත. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 369 අනුව ඉදිරියේදී කපාහැරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මු.රෙ.12 8 (i) (ඌ) | 2019 වර්ෂයේ වී විකිණීමෙන් හිඟව පවතින ආදායම් පිළිබඳ වාර්තා සකස් කිරීමට හා ඒවා අයකර ගැනීමට විධිවිධාන යොදා නොතිබුණි. | මුදල් රෙගුලාසි 128 (i) (ඌ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2020 දී හිඟ ආදායම් ගණනය කර ඇතුළත් කරනු ඇත. |
| | (ii) මු.රෙ 1646 | කෘෂිකර්ම අමාත්‍යාංශය සතු වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් පත් ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත් සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් පත් ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපති වෙත එවිය යුතු වුවත් අමාත්‍යාංශය සතු සංචිත වාහන 12 කට අදාළ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව කටයුතු කළ යුතුය | 2019 නොවැම්බර් මස සිට එම තොරතුරු විගණකාධිපතිතුමට යොමු කිරීමට කටයුතු කර ඇත. |
| | (iii) මු.රෙ. 105 (4) | වාරිමාර්ග කළමනාකරණ අංශයේ ගිරිතලේ ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේත්, නාච්චාදූව සහ වෙලිඔය නේවාසික ව්‍යාපාර යන කාර්යාලවලට අයත් භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ. 105(4) අනුව කටයුතු කළ යුතුය | අදාළ ආයතන වල භාණ්ඩ සමීක්ෂණ නියමිත දිනට අවසන් කරන ලද නමුත් එම භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල පැවැති අඩුපාඩු නිසා නියමිත දිනට පෙර විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. |
| **(ඇ)** | 2015 ජූලි මස 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 වන වගන්තිය | කෘෂිකර්ම අමාත්‍යාංශ සතු අපහරණය කළයුතු වාහන හඳුනාගෙන ඒ පිළිබඳ තොරතුරු අදාළ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර හා අපහරණ ක්‍රියාවලිය නිම කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳ තොරතුරු අදාළ වර්ෂයේ ජූනි 30 දිනට ප්‍රථම පිළිවෙලින් ආකෘති අංක 01 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එසේ සිදු කර නොමැති බැවින් එම ආකෘතිපත්‍ර සම්පූර්ණ කර නොපමාව අදාළ අංශ වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | හා ආකෘති අංක 02 නියමිත පරිදි සම්පූර්ණ කර චක්‍රලේඛ ප්‍රකාරව කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 වගන්තිය. | ස්ථාන මාරු වී පැමිණි හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03 ක් ඇතුළත පවරා ගැනීම හෝ නිරවුල් කිරීම හෝ කළයුතු අතර එම කාලයෙන් පසු එම ශේෂ ගිණුම්ගත නොකළ යුතු බවද දන්වා තිබුණි. එහෙත් අමාත්‍යාංශයේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අංශයේ සිට වෙනත් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු හා පළාත් සභා වෙත ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරීන් 14 දෙනෙකුගේ වර්ෂ 05 කට වැඩි කාලයක් ගත වී තිබූ රු.153,526 ක් වූ අය විය යුතු ණය ශේෂ 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අවු.28 ට වඩා පැරණි ණය ශේෂ බැවින් ලිපිගොනු නොමැති වීම නිසා තොරතුරු සොයා ගැනීම අසීරු වී ඇත. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 369 ට අනුව ණය කපාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **අග්‍රිම කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වාරිමාර්ග අංශය ඉටුකිරීමට සැලැසුම් කරන ලද කාර්යයන් සඳහා භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට සැලැසුම් කර තිබුණු මුළු අග්‍රිම අවශ්‍යතාවය රු.2,455,715,000 ක් වී තිබුණද භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු අග්‍රිමය රු.1,104,073,173 ක් වී තිබුණි. | වර්ෂය ආරම්භයේ සිට අනුමත ප්‍රතිපාදන උපයෝජනය සඳහා ප්‍රායෝගික සැලසුම් සකස් කළ යුතුය. | අග්‍රිම ලැබෙන ආකාරය අනුව අග්‍රිම උපයෝජනය කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ඒ අනුව භාණ්ඩාගාරයෙන් නොලැබුණු අග්‍රිමය ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 55 ක් වී තිබුණි. | | |
| (ආ) | මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්යය නිමකර අතුරු අග්‍රිම නිරවුල් කළයුතු වුවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් 50 දෙනෙකු විසින් අවස්ථා 105 කදී ලබාගෙන තිබුණු රු.2,212,254 අතුරු අග්‍රිම පියවීමට දින 01 සිට දින 80 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙම තත්වය හැකිතාක් අවමකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 371(3) ප්‍රකාරව ප්‍රයෝජනයට ගැනීම අනිසිවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම නොගත යුතුය යන්න සඳහන් වුවද ප්‍රවර්තන වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් 11 දෙනෙකු අවස්ථා 14 කදී ලබාගත් රු.170,059 ක තත්කාර්යය අතුරු අග්‍රිම දින 01 සිට දින 06 දක්වා කාලයක් අතර රඳවාගෙන එම සම්පූර්ණ මුදලම ආපසු පියවා තිබුණි. | මුදල් රෙගුලාසි 371(3) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නොවැළැක්විය හැකි හේතුන් මත අදාළ කාර්යයන් සිදු කිරීමට නොහැකි වී ඇත. මෙවැනි තත්වයන් වළක්වා ගැනීමට නිලධාරීන්ට උපදෙස් ලබාදීමට කටයුතු කරමි. |

**2.2** **ආදායම් කළමනාකරණය**

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක අංක 118-1-10-1-1409 දරන වැය විෂය යටතේ වී මිලදී ගැනීම සඳහා ග්‍රාමීය සංවර්ධන අංශය වෙත රු.3,118,000,000ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ අතර ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 20 ක් සඳහා රු.1,959,912,319 ක් වී මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08 ක් මඟින් එයට අදාළව අංක 118-2003-07-00 දරන ආදායම් සංකේතය යටතේ මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණේ රු. 299,814,540 ක් | සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආදායම් ගණනය කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2020 දී හිඟ ආදායම් ගණනයකර ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

පමණි. මේ අනුව වී විකිණීමෙන් රජයට ලැබිය යුතු සැලකිය යුතු හිඟ ආදායමක් ගණනය කර ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2.3 වියදම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වැය විෂයයන් 20 ක එකතුව වූ රු. 6,762,400,000 ක ප්‍රතිපාදන සහ පුනරාවර්ථන වැය විෂයයන් 08 ක එකතුව වූ රු.5,104,666 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පුරෝකථනය කළද නොවැළැක්විය හැකි තත්වයන් මත ඉතිරි වීම් සිදු වී තිබුණි. |
| (ආ) | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදි පුරෝකථන සිදු නොකිරීම නිසා ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 කට වැඩියෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 76 ක හා ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ට වැඩියෙන් පුනරාවර්ථන වැය විෂයයන් 85 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ප්‍රාග්ධන හා පුනරාවර්ථන වැය විෂයයන් සඳහා සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනය රු.7,634,792,000 වූ අතර ඉන් රු.3,314,504,316 ක් එනම්, සියයට 43.41 ක් ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය | වියදම් පාලනය, අවශ්‍යතා ඇති නොවීම, කාර්ය මණ්ඩල වෙනස් වීම, අක්මුදල් නොලැබීම වැනි විවිධ කරනු මත ඉතිරි වීම් සිදු වී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය විෂයයන් 04 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් අතිරේක ප්‍රතිපාදන රු.441,167,370 ක් සලසාගෙන තිබුණද එම අතිරේක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | - එම - | සැලසුම්ගත ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම, තාක්ෂණික ගැටළු, කාලගුණ තත්වයන් නිසා, අවශ්‍ය අක්මුදල් නොලැබීම යන කරුණු නිසා ඉතිරිවීම් සිදු වී තිබුණි. |
| (ඈ) | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී වැය විෂයයන් 5 ක් සඳහා අධි ඇස්තමේන්තු සකස් කර තිබීම හේතුවෙන් එකතුව රු.93,700,000 ක ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබූ අතර ඉන් සියයට 49 ක් එනම් රු.46,381,000 ක් මු.රෙ.66 මඟින් වෙනත් වැය විෂයයක් සඳහා මාරු කර තිබුණි. මෙම වැය විෂයයන් 5 හි සමස්ථ වියදම මාරු කළ ප්‍රතිපාදනයක් සියයට 22 ක් හෙවත් රු.20,463,552 ක් වූ අතර ඉතිරිය සියයට 27 ක් හෙවත් රු.26,858,448 කි. ඉහත වැය විෂයයන් සඳහා අධිවැය ඇස්තමේන්තු සකස් කර තිබූ අතර මු.රෙ 66 මඟින් අමතර ප්‍රතිපාදනයන් වෙනත් වැය විෂයයන් සඳහා ලබාගෙන තිබියදීත් එම වැය විෂයයන් වල ප්‍රතිපාදන සියයට 15 සිට සියයට 47 ක ප්‍රමාණයකින් ඉතිරි වී තිබුණි. | - එම - | අයවැය චක්‍රලේඛ අනුව වියදම් පාලනය, අමාත්‍ය තනතුරු වෙනස් වීම, කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා නව කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදිකිරීමේ යෝජනාව ක්‍රියාත්මක නොවීම යන කරුනු මත ප්‍රතිපාදන ඉතිරි වීම් සිදු වීම නිසා |
| (ඉ) | 2019 ජූනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛ ප්‍රකාරව 2019 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් වලින් සියයට 15 ක් ඉතිරි කිරීම් ලෙස හඳුනාගතයුතු අතර ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන්කර ඇති | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය | චක්‍රලේඛය නිකුත් කරන විටත් ඇතැම් වැය විෂයයන් වෙනුවෙන් බැඳීම් වලට එළඹීම නිසා ප්‍රතිපාදන ඉතිරි කිරීමට අවකාශ නොලැබුණි. මේ පිළිබඳ අයවැය දෙපාර්තමේන්තුවද දැනුවත් කිරීමට කටයුතු කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදනවලින් තවදුරටත් සියයට 10 ක් අනිවාර්යයෙන් ඉතිරි කළ යුතු බව 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛ මඟින් දැනුම් දී තිබුණි. එහෙත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන වැය විෂයයන් 50 ක රු.10,434,782,000 ක් වූ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක ඉතිරිය රු.2,608,695,500 ක් වියයුතු වුවත් රු.949,643,278 ක් පමණක් ඉතිරිකර තිබුණි. | | |
| (ඊ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක 118-1-10-1-1409 දරන වී මිලදී ගැනීමේ වැය විෂයය සඳහා පරිපූරක ඇස්තමේන්තු 6 ක් මඟින් රු.මිලියන 3118 ක් වෙන්කර ගෙන තිබූ නමුත් ඉන් වියදම් කර තිබුණේ රු.මිලියන 1960 ක් පමණි. ඒ අනුව ඉතිරි වීම් ප්‍රතිශතය සියයට 37 කි. මුල් පරිපූරක ඇස්තමේන්තු 2 ක් මඟින් මෙම වියදම් පියවා ගැනීමට හැකියාව තිබියදී අමතර පරිපූරක ඇස්තමේන්තු 4 ක් මඟින් රු.මිලියන 118 ක් වෙන්කර ගෙන තිබුණි. | අවශ්‍යතා මත සැලසුම් සිදුකර ප්‍රතිපාදන වෙන්කර ගත යුතුය | දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් වරින් වර කරන ලද ඉල්ලීම් අනුව රු.මිලියන 3118 ක ප්‍රතිපාදන ඉල්ලුම් කළද වී මිලදී ගැනීමට හැකි වූයේ රු.මිලියන 1960 ක් පමණි |
| (උ) | ප්‍රතිපාදන අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගැනීමකින් තොරව මු.රෙ.66 උපයෝගීකරගෙන වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරුකිරීම හේතුවෙන් වාරිමාර්ග අංශයේ වැය විෂයයන් 03 ක් සඳහා මාරුකර තිබුණු රු.289,700,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | - එම - | 2019 ජූනි 17 දිනැති අයවැය චක්‍රලේඛය පරිදි රාජ්‍ය වියදම් වඩාත් අරපිරිමැස්මකින් හා නාස්තිය අවම වන පරිදි විධිවිධාන යෙදීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | වාරිමාර්ග අංශයේ වියදම් වැය විෂයය 04 ක් සඳහා සලසන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,480,000 ක් උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | - එම - | 2019 ජූනි 17 දිනැති අයවැය චක්‍රලේඛය පරිදි රාජ්‍ය වියදම් වඩාත් අරපිරිමැස්මකින් හා නාස්තිය අවම වන පරිදි විධිවිධාන යෙදීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.4** **තැන්පත් ශේෂයන්**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------ | ---------------------------------- |
| (අ) | වාරිමාර්ග අංශයේ වර්ෂ 2 කට වඩා පැරණි කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු.1,779,234 ක තැන්පත් ගිණුමෙහි පවතිනමුත් මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 570 අනුව කටයුතු කළ යුතුය. | වගකීම් කාලය ඉකුත් වී තිබූ නමුත් රැඳවුම් මුදල් නිදහස් කර ගැනීම සඳහා ඉල්ලීම් 2019 දෙසැම්බර් 31 දින වන තෙක් ලැබී නොතිබුණ බැවින් ගෙවීම් සිදුකර නොතිබුණි. ඉදිරියේදී ගෙවීම් කටයුතු සිදු කරනු ඇත. |
| (ආ) | කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ සේවයේ නියුක්ත අනියම් සේවකයන්ගෙන් වැටුපෙන් 2017, 2018 සහ 2019 යන වර්ෂවල අයකරන ලද රු.1,486,706 ක් වූ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් දායකය එම අරමුදලට ප්‍රේෂණය නොකර ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් තාවකාලික රඳවාගැනීම් ලෙස තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. එම ගෙවිය යුතු ශේෂයෙන් වර්ෂ 02 කට අධික කාලයක් රඳවා ගත් වටිනාකම රු.379,434 ක් වී තිබුණි. | රජයේ සේවයේ නියුක්ත විශ්‍රාම වැටුප සඳහා හිමිකම් නොලබන සේවකයන් සඳහා පිහිටුවා තිබෙන රාජ්‍ය සේවා අර්ථසාධක ආඥා පනත අනුව කටයුතු කළ යුතුය. | සේවක දායකත්වය අයකරගෙන තිබුණද ආයතනයේ දායකත්වය සඳහා සේවා පුහුණු පාඨමාලාවල ඉතුරුම් ප්‍රමාණවත් නොවුණි. ඉදිරි පුහුණු වැඩසටහන් වල ඉතුරුම් මඟින් 2020 වර්ෂ තුළ අදාළ තැන්පතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**2.5 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ------------ | ---------------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය විෂයයන් 28 ක් යටතේ සලසා තිබූ රු.40,303,499,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළ රු.38,460,072,632 ක් උපයෝජන කිරීමෙන් පසු ඉතිරිය රු.1,843,426,368 ක් විය. එහෙත් එම ඉතිරිය ඉක්මවා රු.23,884,831,921 ක බැරකම් සඳහා බැඳී තිබුණි. | මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් හා බැඳීම් ඇතිකර නොගත යුතුය. | අදාළ වවුචර්පත් ප්‍රමාද වී ඉදිරිපත් වීම මත එම වටිනාකම් බැරකම් ලේඛනයට ඇතුළත් වී නැති බව පිළිගනිමි. |
| (ආ) | ධීවර හා ජලජ සම්පත් අංශය විසින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශයේ සටහන් iii යටතේ සඳහන් බැරකම් හා බැඳීම් පරීක්ෂාවේ දී මු.රෙ. 94 ට පටහැනි ආකාරයෙන් මුදල් වර්ෂය සඳහා මූලධන වැය විෂයයන් 03 ක් යටතේ සලසා තිබුණු ප්‍රතිපාදන රු.47,992,224 කින් ඉක්මවා වියදම් සඳහා බැඳීම් ඇති කරගෙන තිබුණි. එසේම නියම වශයෙන් මුදල් ගෙවීමට සිදුවන කාලය වන විට අවශ්‍ය අධිකාර බලය නොහොත් අතිරේක මුදල් ප්‍රතිපාදන ලැබේ | මුදල් රෙගුලාසි 94 ට පටහැනිව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් හා බැඳීම් ඇතිකර නොගත යුතුය. | අදහස් දක්වා නැත. |

යැයි අපේක්ෂාවෙන් වියදම් හෝ බැරකම් හෝ නොදැරිය යුතුය යන්නද මෙහිදී සලකා බලා නොතිබුණි.

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ)** | අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන යන අංශ වල සේවය කර සේවය අතහැර ගිය නිලධාරීන් 29 දෙනෙකුගේ එකතුව රු.793,931 ක් වූ අය විය යුතු ණය ශේෂයන් වර්ෂ 05 ක කාලයක් ඉක්මවා ගොස් තිබුණද එම ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම ණය ශේෂයන් කපා හැරීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |
| **(ආ)** | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය සහ පාලන ගිණුම් ශේෂ සැසඳුම් ප්‍රකාශනයට අනුව රු.415,636 ක හඳුනා නොගත් ණය ශේෂයක් පැවතියද එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනා නොගත් ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මේ පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට නියමිතය |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ ග්‍රාමීය සංවර්ධන අංශය විසින් ඇමරිකන් ඩොලර් 73,954,055 ක ණය මුදලකට ඕස්ට්‍රේලියාවේ පෞද්ගලික බැංකු 2ක් සමඟ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ගිවිසුම්ගතව කිරි ගවයින් 20,000 ක් ආනයනයට ඕස්ට්‍රේලියාවේ වෙලාඩ් රූරල් එක්ස්පෝර්ට් (Wellaed Rural Export) ආයතනය සමඟ ගිවිසුමක් ඇති කර ගෙන තිබුණි. එම ගිවිසුම අනුව ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමටත්, ඉන් පළමු අදියර යටතේ සතුන් 5,000 ක් ආනයනය කර එම සතුන් සාර්ථක නම්, පමණක් දෙවන අදියර යටතේ අත්තිකාරම් ලබාදී සතුන් 15,000 ක් ආනයනය 2020 වර්ෂය අවසන් වන විට නිම කිරීමටත් එකඟවී තිබුණි. නමුත් අමාත්‍යාංශය වෙත 2018 පෙබරවාරි 27 හා 2018 මැයි 04 දින ඉදිරිපත් කළ විගණන වාර්තා මඟින් හා ප්‍රසිද්ධ ජනමාධ්‍ය විසින් පෙර ගෙනා සතුන් අසාර්ථක බව පෙන්වා දී තිබුණි. තවද, 2018 වර්ෂය තුළ අමාත්‍යාංශය යටතේ මෙම ව්‍යාපෘතියට වැය දැරීමට විසර්ජන පනතින් ප්‍රතිපාදනද නොතිබියදී ඉතිරි සතුන් 15,000 ආනයනය සඳහා ඇමරිකන් ඩොලර් 55,465,541 ක මුළු මුදලින් සියයට 20 ක අත්තිකාරම් ලෙස 2018 මැයි 08 දින ඇමරිකන් ඩොලර් 11,093,108 ක් එනම් රු1,749,672,697 ක් ගෙවා තිබුණි. නමුත් ඉහත යෝජිත | ගෙවන ලද මුදලට අදාල සතුන් කඩිනමින් ලබාගෙන ව්‍යාපෘතිය සාර්ථකව නිම කළ යුතුය. | මුදල් අමාත්‍යාංශයේදී ගනු ලැබූ තීරණයකට අනුව 2019 වර්ෂයට ගිණුම්ගත කිරීමට එකඟව මුදල් ගෙවා ඇත. එමෙන්ම ව්‍යාපෘතිය අත්හිටුවා නොමැති අතර දෙවන අදියර විෂය පථය වෙනස් කරමින් ඉටුකරයි. පළමු අදියරේ ගොවිපොළ සඳහා සේවා සැපයීම් සිදුකරයි. |

| | | | |
|---|---|---|---|
| | කිසිම සතෙකු 2018 සිට 2020 අගෝස්තු දක්වාම ආනයනය කර නොතිබුණි. | | |
| (ආ) | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වෙරළ පුනරුත්ථාපනය සහ සම්පත් කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ධීවර සමාජ සංවර්ධන අංශය වෙත වෙන්කර තිබුණු රු.මිලියන 70 ක ප්‍රතිපාදනය, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත මත්ස්‍ය රකුම් හල් (Hatchery) ඉදිකිරීම සඳහා පවරා දී තිබුණු අතර එයින් රු.57,288,684 ක් වැය කර තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂා කළ නිමැවුම් ලෙස නව තාක්ෂණය හඳුන්වාදීමට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, කිවුල්දිය හා වෙරළ ජලජීවීන් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසුගිය වර්ෂය හා සැසඳීමේ දී මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරගැනීමට අදාළ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යනාදි වශයෙන් හඳුනාගෙන තිබුණත් වර්ෂ ගණනාවක සිට අපේක්ෂිත නිමැවුම් ලබාගැනීමට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් යොදවා ඇති බව නිරීක්ෂණය නොවුණු අතර එම මුදල් වෙනත් කාර්යයන්වලට යෙදවීම අඛණ්ඩව සිදුවී තිබුණි. | අපේක්ෂිත නිමැවුම් ලබාගැනීම සඳහා අදාළ කාර්යයන් කරවීමට අරමුදල් යෙදවිය යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | වාර්ෂික ඇස්තමේන්තු මගින් රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු හම්බන්තොට, යාපනය සහ මඩකලපුව ඇතුළත් මුහුදුබඩ දිස්ත්‍රික්ක 10 ක ගම්මාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. එම ප්‍රතිපාදනය උපයෝගී කරගෙන දෙපාර්තමේන්තුව හා ජාතික | ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහාම යොදාගත යුතුය. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ඉකුත් වර්ෂයක දී ආරම්භ කළ දියවර පියස ධීවර නිවාස හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ ආධාර වැඩසටහන ක්‍රියාත්මක කර ඒ වෙනුවෙන් රු.මිලියන 46 ක් වැයකර තිබුණි. | | |
| (ඇ) | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අංශයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට මිරිදිය ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන 30 බැගින් අරමුදල් සැපයීම 2008 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණි. තවද, 2019 වර්ෂය දක්වා අඛණ්ඩව ඒ වෙනුවෙන් මුදල් වෙන්කර වියදම් දරා තිබුණි. 2008 ජූලි මස 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ව්‍යාපෘතියට රු.මිලියන 30 බැගින් වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණ ද අංක 08/1248/351/016 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ශ්‍රී ලංකා මහා බැංකුව සිදුකර තිබූ අදහස් දැක්වීම අනුව වසර 5 කදී ධීවර කර්මාන්තයේ යෙදෙන්නන්ගේ ආදායම වැඩිවීම හේතුවෙන් ස්වයං මූල්‍යකරණයකට යොමු වීම අවශ්‍ය බව දක්වා තිබුණි. එහෙත් අමාත්‍යාංශය විසින් මෙම වැය විෂයය සඳහා වර්ෂ 05 ක් ඉක්මවා තවත් වර්ෂ 07 ක් අඛණ්ඩව රු.මිලියන 30 බැගින් අධිකාරිය වෙත අරමුදල් වෙන්කර දී තිබුණි. එහෙත් ධීවර කර්මාන්තයේ යෙදෙන්නන්ගේ ආදායම වැඩිවීම සලකා ස්වයං මූල්‍යකරණයකට යොමු කිරීමක් පිළිබඳව පසුවිපරම් කිරීමක් හෝ අධිකාරියේ ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණයක් හෝ කළ බවට තොරතුරු නොතිබුණි. | මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත වාර්ෂිකව ප්‍රතිපාදන ලබාදීම නවතා ස්වයං මූල්‍යකරණයකට යොමු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

**3.2** වයාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අංශයේ 2019 වර්ෂය සඳහා ධීවර වරායන් හා නැංගුරම් පොළවල් ඉදිකිරීම ඇතුළු ක්‍රියාකාරකම් 20 ක් සඳහා රු.මිලියන 1587 ක මුදලක් වෙන්කර තිබුණු අතර වර්ෂය තුළ ධීවර වරායන් 05 ක් ඉදිකිරීම ඇතුළුව ක්‍රියාකාරකම් 11 ක් සඳහා රු.මිලියන 1067 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ. | | |
| (අ) කළමැටිය ධීවර වරාය ඉදිකිරීම 2014 වර්ෂයේ ආරම්භකර 2017 වර්ෂයේ දී අවසන් කළ යුතුව තිබුණ ද 2019 වර්ෂයේදීද රු.මිලියන 105 ක් මේ සඳහා වැයකර තිබියදීත් මෙහි ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. | අපේක්ෂිත කාලපරිච්ඡේදය තුළ කාර්යයන් අවසන් කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) 2017 වර්ෂයේ අවසන් කළ යුතුව තිබුණු හලාවත හරිත ධීවර වරාය ඉදිකිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ දී ද රු.මිලියන 28 ක් වැය කර තිබුණි. එහෙත් වර්ෂ 2 කට වඩා කාලයක් ප්‍රමාද වී ඇතත් ව්‍යාපෘතිය නිම කිරීමට අපොහොසත්ව තිබුණි. | අවසන් කළ යුතුව පවතින ඉදිකිරීම් කටයුතු නිමකරවාගෙන භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) රු.මිලියන 350 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ 2018 ජුනි අවසන් කළ යුතුව තිබුණු මිරිස්ස හරිත ධීවර වරාය ඉදිකිරීමේ ඉතිරි වැඩ වෙනුවෙන් 2019 වර්ෂය සඳහා රු.මිලියන 18 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද ඒ සඳහා කිසිදු මුදලක් වැය කර නොතිබුණි. | ඉදිකිරීම් නිමකරවාගෙන භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

| | | |
|---|---|---|
| (ඇ) මුළු ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 392 ක් වූ මයිලිඩ්ඩි වරාය, ධීවර වරායක් බවට පත්කිරීම හා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2019 මැයි වන විට අවසන් කළ යුතුව තිබුණි. 2019 වර්ෂයේ ඒ වෙනුවෙන් රු.මිලියන 88 ක් වැය කර තිබුණ ද දියකඩනය ඉදිකිරීම සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් එහි ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. | - එම - | අදහස් දක්වා නොමැත. |
| (ඉ) 2018 ජුනි හා 2017 ජූලි අවසන් කළ යුතු ව්‍යාපෘති වූ පැරැලිය නැංගුරම්පළ ඉදිකිරීම හා ගාල්ල ජැටිය ධීවර වරාය ඉදිකිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ දී පිළිවෙලින් රු.මිලියන 17 ක් හා රු.මිලියන 22 ක් වැය කර තිබුණ ද එම ඉදිකිරීම් අවසන් කර භාරදීම සිදුකර නොතිබුණි. | - එම - | අදහස් දක්වා නොමැත. |
| (ඊ) 2018 ජනවාරි අවසන් කළ යුතුව තිබුණු කරෛයිනගර් යාත්‍රාංගනය ඉදිකිරීම **I, II, III** අදියරයන් සඳහා 2019 වර්ෂයට රු.මිලියන 39 ක් වෙන්කර ඉන් රු.මිලියන 13 ක් පමණක් වැය කර තිබුණ ද අතර වැඩ අවසන් කර නොතිබුණි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නිමකරවාගෙන භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (උ) 2019 මාර්තු සිට 2019 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතියේ **III** වන අදියර අවසන් කළ යුතු වුවත් 2019 වර්ෂයේ දී රු.මිලියන 63 ක් වැය කර තිබුණ ද 2019 දෙසැම්බර් 31 දිනට එහි ප්‍රගතිය සියයට 38 ක් පමණ විය. | නියමිත කාලපරිච්ඡේදය අවසානයේදී ව්‍යාපෘති කාර්යයන් නිම කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජීවී වගා ක්ෂේත්‍රයට දීර්ඝකාලීන ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2017 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා රජය හා නෝර්වීජියානු විදේශ කටයුතු අමාත්‍යාංශය අතර රු.149,400,000 (ක්‍රෝන් 8,300,000) ක ප්‍රදානයකට ගිවිසුම්ගතවී තිබුණි. ගිවිසුමේ 10.1 හා 10.3 කොන්දේසිවලට අනුව උක්ත ව්‍යාපෘතියට අදාළ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ විගණකාධිපති විසින් විගණනය කළ යුතු බව දක්වා තිබුණ ද ඉකුත් වර්ෂ 2 ක සඳහා හා සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2019 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත කාලපරිච්ඡේදයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. | පිළිතුරු ලබාදී නොතිබුණි. |

## 3.4 ප්‍රසම්පාදනය

**පහත සඳහන් නිරීක්සණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා බදු පදනම මත ලබාගත් ගොඩනැගිල්ල<br>මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) පාර්ලිමේන්තු කාරකසභා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම හා අතිරේක කාර්යාල ඉඩකඩ අවශ්‍යතාවය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය ස්ථාපිත කර ඇති "ගොවිජන මන්දිරය" යොදා ගැනීමට තීරණය කර තිබුණි. එම නිසා කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රාජගිරියේ මහල් 09 | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව රජයට උපරිම වාසි ලැබෙන අයුරින් කටයුතු කළ යුතුය | අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් හා ඒ සඳහා 2016 මාර්තු 02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සිදු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | කින් යුතු පෞද්ගලික සමාගමකට අයත් ගොඩනැගිල්ලක් 2016 අප්‍රේල් 08 දින සිට මසකට රු.මිලියන 21 ක බදු කුලියක් හා රු.මිලියන 6 ක සේවා ගාස්තු ගෙවීමේ පදනම මත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 සහ 3.2.2 වගන්තිවලට අනුකූලව කටයුතු කිරීමකින් තොරව ලබාගෙන තිබුණි. | | |
| **(ii)** | සමස්ථ කාර්ය මණ්ඩලය 300 ක් පමණ වූ කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ගොඩනැගිලි අවශ්‍යතාවය වර්ග අඩි 66,500 ක් වුවද බදු පදනම මත ලබාගෙන තිබූ මහල් 09 කින් යුතු ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 103,000 ක් විය. තවද මු.රෙ.835(2) (ඉ) ප්‍රකාර බදු කාලසීමාව උපරිමය වර්ෂ 03 ක් විය යුතු වුවද බදුකරුගේ ඉල්ලීම මත එය අවුරුදු 05 ක් ලෙස දක්වා තිබීම හා වසර 03 කින් පසු බදු කුලිය සියයට 15 කින් වැඩි කිරීමට හා වසර 02 ක බදු කුලිය වූ රු.මිලියන 504 ක මුදල එකවර ගෙවීමේ කොන්දේසි පිළිගෙන තිබුණි. | පවත්නා නීති රීති හා මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කළ යුතුය. | කෘෂිකර්ම අමාත්‍යතුමා විසින් 2016 පෙබරවාරි 16 දින ඉදිරිපත්කර තිබූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට 2016 මාර්තු 10 දින ලැබුන අනුමැතිය මත අමාත්‍යාංශය සඳහා නව කාර්යාල පරිශ්‍රයක් ලබාගැනීමට කටයුතු කර ඇත. |
| **(iii)** | එසේම රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව ගොඩනැගිල්ලේ වෙළඳපළ කුලිය මාසිකව රු.මිලියන 13.5 ක් වුවද එය ඉක්මවා රු.මිලියන 21 ක කුලියක් ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන1,229.58 ක බදු මුදල් (**VAT** හා **NBT** ඇතුළුව), සේවා ගාස්තු රු.මිලියන 229.20 ක්, විදුලි | **- එම -** | අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව එවකට සිටි අමාත්‍යාංශ ලේකම් හා ගොඩනැගිලි හිමිකරු විසින් ගිවිසුමට අත්සන් කර තිබූ අතර ඒ අනුව ගිවිසුමේ කොන්දේසි ක්‍රියාත්මක කර ඇත. |

බිල්පත් සඳහා රු.මිලියන 63.64 ක් සහ ජල බිල්පත් සඳහා රු.මිලියන 2.017 ක් ලෙස එකතුව රු.මිලියන1,524.44 ක මුදලක් වැයකර තිබුණි. ඊට අමතරව මෙම ගොඩනැඟිල්ල කාර්යාල සංකීර්ණයක් ලෙස භාවිතා කිරීමට අවශ්‍ය කාමර බෙදා වෙන් කිරීම, බුමුතුරුණු ඇතිරීම්, තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම කාර්යාල ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.මිලියන 342.7 ක්ද වැය කර තිබුණි. මෙසේ ගෙවීම් කර තිබුණද ගිවිසුම් ගත දිනයේ සිට මුල් මාස 15 තුළ අවශ්‍ය කාර්යාලීය පහසුකම් (කාමර බෙදා වෙන් කිරීම, බුමුතුරුණු ඇතිරීම්, තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම ) නොමැති වීම මත ගොඩනැඟිල්ල කාර්යාලීය කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. එහෙත් කාරක සභා ක්‍රමය ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා පූර්ණ වශයෙන් යොදාගෙන නොමැති බැවින් අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 2020 ජනවාරි මස 31 දින සිට නැවතත් අමාත්‍යාංශය පැරණි කාර්යාල සංකීර්ණය වූ “ගොවිජන මන්දිරය” වෙත රැගෙන ගොස් තිබුණි. එහෙත් 2020 ජනවාරි මස සිට 2020 අගෝස්තු මස දක්වා ගිවිසුම ප්‍රකාරව රු.මිලියන 28.05 ක මුදලක් බදු කුලී හා සේවා ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. එමෙන්ම 2021 අප්‍රේල් 01 දින දක්වාම ගිවිසුම ප්‍රකාරව බදු කුලී හා සේවා ගාස්තු ගෙවීමට අමාත්‍යාංශය බැඳී පවතී.

## 3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් ජාතික පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගුණාත්මක පොහොර ආනයනය කිරීම පිළිබඳ සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් වී සඳහා පොහොර අවශ්‍යතාවය තීරණය කිරීමේදී කන්නයේ ඉතිරි පොහොර තොග, යාවත්කාලීන පොහොර නිර්දේශ හා යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වාගෙනයාමක් සිදුකර නොතිබුණි. | එක් එක් කන්න වල වගා කරනු ලබන කුඹුරු ඉඩම් අනුව පොහොර අවශ්‍යතාවයන් තීරණය කිරීම සඳහා යාවත්කාලීන තොරතුරු පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. | තොරතුරු පද්ධතිය සකස් කරමින් පවති. |
| (ii) තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව රසායනික පොහොර ආනයනය කිරීම සඳහා සමාගම් තෝරාගෙන නොතිබුණි. | තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ප්‍රතිපත්ති සකස් කිරීමෙන් අනතුරුව යෝජිත ක්‍රම අනුගමනය කෙරේ. ඉදිරියේදී අභිලාශය කැඳවීම මඟින් රජයට වඩාත් වාසිදායක ලෙස සැපයුකරුවන් තෝරාගැනීමට කටයුතු සිදු කෙරේ. |
| (iii) ආනයනික රසායනික පොහොරවල ගුණාත්මක බව පරීක්ෂා කිරීම සඳහා නියැදි ලබාගැනීම වරාය තුලදී සිදු කළයුතු වුවද පොහොර ආනයනය කරනු ලබන සමාගම් සතු විවෘත ගබඩා වලින් නියැදි ලබා ගැනීම සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. | අභ්‍යන්තර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය | වරායේ බහාලුම් තුලින් සෘජුවම පොහොර නියැදි ලබාගැනීමේ ක්‍රමවේදය සකස් කල පසුව මෙම ගැටළුව ඇති නොවේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | ආනයනික රසායනික පොහොර පරීක්ෂා කිරීම සඳහා රසායනාගාර තෝරා ගැනීම, රසායනාගාර වෙත සාම්පල් යැවීම, රසායනාගාර වාර්තා භාරගැනීම, පරීක්ෂා කිරීම හා වෙළඳ අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදය පිළිබඳව පොහොර ලේකම් කාර්යාලයේ විධිමත් හා ප්‍රමාණවත් නියාමනයක් හා සුපරීක්ෂණයක් සිදු නොවීම. | පොහොර ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය | රසායනාගාර වාර්තා ලබාගැනීම විද්‍යුත් තැපැල් මඟින් ලබාගැනීමටත්, අභිලාෂය කැඳවීම මඟින් රසායනාගාර තෝරාගැනීමට සහ ලංකා පොහොර සමාගම සතු රසායනාගාර පවරා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශ මඟින් අනුමැතිය පතා ඇත. |
| (v) | ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් 2018 සහ 2019 වර්ෂයේ ආනයනික රසායනික පොහොර වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ලබාගනු ලබන නියැදි වලට අදාළ රසායනාගාර වාර්තා වලට අදාළව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ව්‍යාජ ලෙස සකස් කරන ලද රසායනාගාර වාර්තා 55 කට ආසන්න ප්‍රමාණයක් නිරීක්ෂණය විය. ඒ අනුව පොහොර වර්ග 9 කට අදාළ මෙ.ටො.81,655 ක ගුණාත්මකභාවයෙන් අඩු ප්‍රමිතියෙන් තොර පොහොර වෙළඳපලට නිකුත්කර තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. | ව්‍යාජ රසායනාගාර වාර්තා පිළියෙල කර ඇති නම් අදාල නිලධාරීන් සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වා නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වීම. | ව්‍යාජ විශ්ලේෂණ වාර්තා ලිපිගොනු තුලට ඇතුලත් කල නිලධාරීන් පිළිබඳව රජයේ විගණන නිලධාරීන්ගේ වාර්තා ලැබුණු පසු විනයානුකූල පියවර ගනු ලැබේ. |
| **(ආ)** | 2019 දෙසැම්බර් 31 දිනට වැය විෂය අංක 118-2-3-20-2509 යටතේ රු.83,973,934 ක වියදමින් කෘෂි ගම්මාන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා කහත්තෙවෙල ගම්මානය තෝරාගෙන තිබුණි. එම ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | 2015 මැයි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2015 හි 06 ඡේදය ප්‍රකාරව මහජන මුදල් වැයකර රාජකාරී උත්සව පැවැත්වීම සීමා කළයුතු බවත් වියදම අවම වන සේ සංවිධානය කළයුතු බවත් සඳහන් කර තිබුනද රු.1,486,083 ක් වැයකර වැඩසටහන හඳුන්වාදීමේ උත්සවයක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය | එකඟ වෙමි. එසේ වුවද මෙලෙස ප්‍රචාරක කටයුතු සිදුකර ඇත්තේ මෙම වැඩසටහන දිපව්‍යාප්තව සිදුකිරීමේ මූලික අපේක්ෂාවෙන් යුතුව බව නිරීක්ෂණය වේ. |
| (ii) | ගොවි සංවිධාන කිහිපයක එකමුතුවකින් ඉතා සංවිධානාත්මක කෘෂි සමාගමක් බිහිකරගත හැකි වුවද කහත්තෙවෙල ලිමිටඩ් නමින් අමාත්‍යාංශයේ ඍජු මැදිහත් වීමකින් හා අධීක්ෂණයකින් තොරව ජනතා සමාගමක් පිහිටුවා තිබුණි. එම සමාගම පිහිටුවීමේ අරමුණින් කිහිපදෙනෙකුගේ එකතුවෙන් 2018 වර්ෂයේදී ගොවි සංවිධානයක් පිහිටුවාගෙන තිබුණද එම ගොවි සංවිධානය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි | ප්‍රදේශයේ ගොවි සංවිධාන වල එකමුතුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය | නිරීක්ෂණ හා එකඟ වෙමි. |
| (iii) | සියලුම ප්‍රතිලාභ එම සමාගමට ලැබෙන සේ කටයුතු සලසා තිබුණි. සමාගමේ කාර්යාලීය ලී බඩු සහ යන්ත්‍රෝපකරණ සඳහා රු.1,406,217 ක් සහ ගොවීන් සඳහා රු.45,914,600 ක් වැයකර ආරක්ෂිත ගෘහ ලබා දී තිබූ අතර එම ආරක්ෂිත ගෘහ වටිනාකමින් සියයට 50 ක් ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම වැඩසටහන යටතේ අදාළ ප්‍රතිලාභ ගොවීන් වෙත ලැබෙන සේ කටයුතු කළ යුතුය. | නිරීක්ෂණ හා එකඟ වෙමි. ගිවිසුම ප්‍රකාරව දෙවන කන්නයේ සිට 50% ක ගොවි දායකත්ව සමාගම වෙත අයකර එම මුදල් බැංකු ගත කිරීමට උපදෙස් ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| (iv) එමෙන්ම රු.770,000 ක වටිනාකමැති විද්‍යුත් පරිපථ 35 ක් ජනතා සමාගම වෙත ලබාදී තිබූ අතර එකක් මසකට රු.1,000 ක මුදලකට ගොවීන්ට කුලී පදනම මත ලබාදී සමාගමට ආදායමක් ලබාගත යුතු වුවද එම ආදායම රැස්කර නොතිබුණි. යන්ත්‍රසූත්‍ර ගබඩා කිරීමට හා එළවළු සහ පළතුරු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සහිතව ආදර්ශ ගොවිපලක් ලෙස වැඩි දියුණු කළ සංඝරාජ පිරිවෙන් පරිශ්‍රය මසකට රු.1,000 ක් වැනි අඩු කුලියකට ජනතා ගොවි සමාගම වෙත බදු පදනම මත ලබාදීමට කටයුතු කර තිබුණි. | අදාල ආදායම් ලබාගැනීමට කටයුතු කළ යුතුය. | නිරීක්ෂණ හා එකඟ වේ. |
| (v) එසේම රු.මිලියන 10 කට ආසන්න වටිනාකමැති ආරක්ෂිත ගෘහ, පළතුරු පැල, කෘෂි උපකරණ හා මී මැසි පාලනය සහ උපකරණ ඉහත ජනතා ගොවි සමාගමේ කොටස්කරුවන් වෙත නොමිලේ කිසිදු පදනමකින් තොරව ලබාදී තිබුණි. | සියළුම ගොවි ජනතාවට අදාළ ප්‍රතිලාභ ලැබෙන සේ කටයුතු කළ යුතුය | නිරීක්ෂණ හා එකඟ වෙමි. |

**04.** **මානව සම්පත් කළමණාකරනය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක, තෘතීයක මට්ටමේ තනතුරු 01 ක, ද්වීතියක මට්ටමේ තනතුරු 01 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 10 ක පුරප්පාඩු පැවතියද එම තනතුරුවලට බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු වී ඇති අදාළ තනතුරු පිරවීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 36 ක්, තෘතියික මට්ටමේ තනතුරු 05 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 301 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 20 ක් පුරප්පාඩුව පැවතියද එම තනතුරු වලට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු වී ඇති අදාළ තනතුරු පිරවීමට කටයුතු කරමින් පවතින අතර ප්‍රාථමික මට්ටමේ තනතුරු සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |